CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# පාර්ලිමේන්තුව විසුරුවාහැරීමේ නිවේදනය පිළිබඳව වූ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශය

***2018 දෙසැම්බර් 13 වැනි දා, කොළඹ, ශ්‍රී ලංකාව :*** පසුගිය නොවැම්බර් 9 වැනි දින පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් සහ මහ මැතිවරණයක් කැඳවමින් ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද නිවේදනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වූ වක් බව ඒකමතිකව තීරණය කරමින් අද දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දෙන ලද තීන්දුව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් උද්යෝගිමත් ලෙස සතුටින් පිළිගනී. ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම තීන්දුව ඓතිහාසික වූවක් වන අතර එය පැමිණෙන්නේ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාදාමයන් මෙතෙක් නොවූවිරූ සහ දැඩි පීඩනයකට හසුව පවතින ආතිතමය මොහොතකය.

මෙම තීන්දුව දීමෙහිදි අගවිනිසුරු නලින් පෙරේරා මහතා සහ බුවනෙක අළුවිහාරේ, සිසිර ජේ. ද ආබෲ, ප්‍රියන්ත ජයවර්ධන, ප්‍රසන්න එස්. ජයවර්ධන, විජිත කුමාර මලල්ගොඩ සහ මුර්දු ප්‍රනාන්දු යන විනිසුරු තුමන් සහ තුමියන්ගෙන් සමන්විත වු සත් පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකුල නිසි ක්‍රියාදාමය නගා සිටුවීමට ක්‍රියා කොට ඇත. අධිකරණයේ ස්වාධීනත්වය, ප්‍රජාතන්ත්‍රවාදය, මූලික අයිතිවාසිකම්, නීතියේ අධිපත්‍ය සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙත වු තම කැපවීම මෙසේ දැඩි ලෙස හඟවා සිටීම පිළිබඳව අපි අධිකරණය වෙත ප්‍රශසංසාව පල කොට සිටින්නෙමු.

මෙම තීන්දුව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නිවේදනය අත්හිටුවීමේ තීන්දුව ද විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂක ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තු මහතා විසින් ගොනුකරණු ලැබූ පෙත්සම් ඇතුළු පෙත්සම් ගනනාවක් විභාග කිරීම සඳහා අවසර දීමට ගත් තීන්දුව ද යනා දී අධිකරණයේ පෙර තීන්දු වල ඉදිරි වර්ධනයක් වෙයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා කල උත්සාහයන්ට එරෙහිව අධිකරණයට පෙත්සම් ඉදිරිපත් කල එකම සිවිල් සමාජ සංවිධානය විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය වෙයි. ජනාධිපතිවරයාගේ එම උත්සාහය නිතිවිරෝධී සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වුවක් වන බව වත්මන් අර්බුදය ආරම්භයේ සිටම අප දැරූ ස්ථාවරය වෙයි.

සියලු දේශපාලන ක්‍රියාකාරී කොටස් විසින් දැන් මෙම තීන්දුව පිළිගැනීමට, ඊට ගරු කිරීමට සහ එය අනුගමනය කිරීමට ක්‍රියා කරනු ඇතැයි ද එසේ කොට වත්මන් අර්බුදයට ඉක්මන් විසඳුමක් ලබා දීමට කටයුතු කරණු ඇතැයි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලාපොරොත්තු වෙයි. ශ්‍රී ලංකාවේ

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org

ප්‍රජාතන්ත්‍රවාදය, එහි පුරවැසියන් සහ එහි ආර්ථිකය විසින් මෙම අර්බුධයෙහි විනාශකාරී ප්‍රතිඵලයන් තවදුරටත් අත්විඳිය යුතු නොවනවා පමණක් නොව එවැන්නක් දැරීමටද හැකියාවක් නොපවතී.

විරාන් කොරයා, භවානී ෆොන්සේකා, ක්‍යාති වික්‍රමනායක සහ ඉන්ශිරා ෆලීක් මෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ නීතිඥයන් ලෙස කටයුතු කල අතර ආර් .එම්. බාලේන්ද්‍ර විසින් ඔවුන්ට උපදෙස් සපයන ලදි.

මෙම කාරණය සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පෙර මාධ්‍ය ප්‍රකාශයන් මෙහි, මෙහි සහ මෙහි දැක් වේ.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org